**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **40කි.**

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

---

Department of Education _Western Province

(01) අක්දාවේ පරලොව ජීවිත සම්බන්ධ සියලු කරුණු අඩංගුවන කොටස කුමක් ද?

(1) ඉලාහියියාත් (2) අන්-නුබුව්වාත් (3) අර්-රුහ්හානියත් (4) අස්-සම්ඉයියාත්

(02) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) හදීස් ආරක්ෂා කිරීමේ ප්‍රයත්නයේ දී මුල් වරට හදීස් එක්රැස් කිරීමට සහය වූයේ කවරෙක් ද?

(1) ඉමාම් මාලික් (රහ්) (2) ඉමාමේ බුහාරි (රහ්) (3) ඉමාම් සුහ්රි (රහ්) (4) ඉමාම් අහමද් (රහ්)

(03) මුහුද දෙබෑ කර ප්‍රාතිහාර්‍ය පෙන් වූ නබිවරයා කවරෙක් ද?

(1) මූසා (අලෛ) (2) ඊසා (අලෛ) (3) සාලිහ් (අලෛ) (4) මුහම්මද් (සල්)

(04) සුහුෆ් පහළ වූ නබිවරුන් අතරින් කුර් ආනයේ සුරතල් ගාෂියාවේ ප්‍රකාශයට පත් කර ඇති නබිවරු කවුරුන් ද?

(1) ආදම්(අලෛ), ෂිද් (අලෛ) (2) මූසා (අලෛ), ඉබ්රාහිම් (අලෛ)

(3) ඉද්රීස් (අලෛ), ඉබ්රාහිම් (අලෛ) (4) ඊසා (අලෛ), මුහම්මද් (සල්)

(05) ''මම ජීවත් ව සිටිය දී ඉස්ලාම් විනාශ වී යනවාට වඩා ඉස්ලාමය ජීවත්ව සිටිය දී මම මිය යාම උතුම්'' යන බව පැවසූ ඉමාම් වරයා කවු ද?

(1) ඉමාම් බුහාරි (රහ්) (2) ඉමාම් අහ්මද් (රහ්) (3) ඉමාමේ ෂාෆි (රහ්) (4) ඉමාම් සුයුද්දි (රහ්)

(06) අනෙකුත් නබිවරුන්ට වඩා තමාට විශේෂයෙන් පිරිනමන ලද අංග අතරින් එකක් ලෙස නබි(සල්) තුමා පවසා ඇති දෙය කුමක් ද?

(1) මා මගින් නබිත්වයට මුද්‍රා තැබීම

(2) මාහට බහු විවාහය අනුමත කර තිබීම

(3) මිහ්රාජ් මගින් දෙවියන් දර්ශනය වීම

(4) කෑබතුල්ලාහ් තවාෆ් කිරීමට හිමිවීම

(07) අල්ලාහ් පමණක් එකම දෙවියා ලෙස පිළිගෙන ඔහුට යටත්වීම හැඳින්වෙන වචනය කුමක් ද?

(1) අහ්ලුල් සුන්නාහ් (2) තම්හිද් (3) තරීකා (4) තබ්ලිඃ

(08) නබි(සල්) තුමානන් මාහී, හාසීර්, ආකිබ් යන නම් වලින් තමා හඳුන්වා දුන්නේ ය. මෙහිදී ආකිබ් යන තේරුම කුමක් ද?

(1) විනාශ කර දමන්නා (2) එක්රැස් කරන්නා (3) අවසානයා (4)ස්ථීර වන්තයා

(09) ''මුහාෆලතුස් සලාත්'' යන්නෙහි කෙටි තේරුම කුමක් ද?

(1) සලාතය නියම වීම (2) සලාතය හිය බැතියෙන් ඉටු කිරීම

(3) සලාතය සුරැකීම (4) සලාතය ඉටු කිරීම

(10) නබි (සල්) තුමා සෑම සලාතයකටම පසුව පාරායනතා කළ සුරාවන් මොනවා ද?

(1) සුරා යාසින් , සුරා බකරා, සුරා ෆාතිහා (2) සුරා යාසින්, සුරා වාකිආ, සුරා මුල්ක්

(3) සුරා ඉඃලාස්, සුරා ෆලක්, සුරා නාස් (4) සුරා යාසින්, සුරා බකරා, සුරා කහ්ෆ්

(11) පහත සඳහන් කරුණු වලින් හජ් කිරීමේ දී තහනම් කළ දේ කුමක් ද?

(1) පිරිමින් හා කාන්තාවන්ට සලාම් පැවසීම. (2) කාන්තාවක් මුහුණ ආවරණය කිරීම.

(3) දුආවලට ආමීන් කීම. (4) හරම්හි නිදා ගැනීම

(12) පරලොවේදී සිද්දිකින්වරු, සුහදාවරු සමඟ සිටින්නේ කවුරුන් ද?

(1) දේව භිය ඇති ධානපතීන් (2) නිහතමානී පාලකයන්.

(3) විර මුජාහිද් (4) විශ්වාසනීය සත්‍ය වාදී වෙළෙන් දා

(13) අල් කුරාආනයේ ''තර්තීබුන් නුසුල්'' යනු කුමක් ද?

(1) අල් කුර්ආනය ගොනුකළ පිළිවෙළ (2) අල් කුර්අනය නබි තුමාට පහළ වූ පිළිවෙළ

(3) අල් කුර්ආනය හඳුන්වන නිතී පිළිවෙළ. (4) අල් කුර්ආනය පාරායනා කිරීමේ පිළිවෙළ

(14) ඔබ සලාතය ඉටු කිරීම මගින් අල්ලාහ්ගෙන් පිහිට පතන සේ තව කරුණක් පිළිබඳව පිහිට පතන ලෙස ද, අවධාරණය කරන්නේ ය. එය කුමක් ද?

(1) උපවාසය (2) තිලාවතුල් කුර් ආන් (3) ඉවසීම (4) සදකා.

(15) කලිෆා අබුබක්කර්(ලි) තුමා රාජ්‍ය පාලනය භාරගත් විගසම මුලින් ම සිදු කළ සේවය කුමක් ද?

(1) අල්- කුර්ආනය ග්‍රණ්ඨාරූඪ කිරීම. (2) හමුදා කඳවුරු පිහිටු වීම.

(3) ව්‍යාජ නබිවරු මැඩපැවැත්වීම (4) ආණ්ඩුකාරවරුන් පත් කිරීම.

(16) නබි (සල්) තුමා දුආවට, උපමා කළ ශරීර අවයවය කුමක් ද?

(1) හිස (2) මොළය (3) ඇස් (4) සිත

(17) නබි (සල්) තුමාට වයස අවුරුදු 40 යේ දී හිරා ගුහාවේ පහළ වූ වැකිය අඩංගු සුරාහ්ව කුමක් ද?

(1) සුරා ෆාතිහා (2) සුරා බකරා (3) සුරා වාකිආ (4) සුරා අලක්

(18) අල් - කුරආන් නාමයෙන් මුස්ලිම් වරුන්ව එක්රැස්කොට එක්සේසත් කළ කලිෆාවරයා කවු ද?

(1) උමර් (රළි) (2) උස්මාන් (රළි)

(3) අබුබකර් (රළි) (4) හුසයිෆාතුල් යමානි (රළි)

(19) වහි නිසා කම්පනයෙන් සළුව පොරවාගෙන සිටි නබි තුමාට අල්ලාහ් දුන් විධානය කුමක් ද?

(1) පොරවාගෙන විවේකය ගන්නා ලෙස

(2) නුඹ යුධ කිරීමට සූදානම් වන්න.

Department of Education - Western Province

(3) නුඹ නැගී සිට ජනතාවට බිය ගැන්වෙන අවවාද කරන්න.
(4) නුඹ හිජ්රතය සඳහා සූදානම් වන්න.

(20) යස්රිබ්හි ඉස්ලාම් දේශනා කිරීම සඳහා යවනු ලැබූ දූතයා කවු ද?
(1) අලි (රළි) (2) අම්රු ඉබ්නු ආස් (රළි)
(3) මුස්ආෆ් ඉබ්නු උමයිර් (4) මුආස් ඉබ්නු ජබල් (රළි)

(21) ශ්‍රී ලාංකික මුස්ලිම්වරු හඳුන්වා දුන් ප්‍රවාහන හා වෛද්‍ය ක්‍රමය,
(1) මුහුදු ප්‍රවාහනය, කටු චිකිත්සා වෛද්‍ය ක්‍රමය.
(2) තවලම් , යුනානි.
(3) ගුවන් ප්‍රවාහනය, පාරම්පරික වෛද්‍ය ක්‍රමය.
(4) ජලස්ථි හා ආයුර්වේද.

(22) ව්‍යාපාර හා විවාහ කටයුතුවල දැකිය හැකි පොදු කොන්දේසිය කුමක් ද?
(1) ගැණුම් කරු හා විකුණුම් කරු (2) ෂාහිද්
(4) වලී (4) ඊජාබ් කබූල්

(23) ව්‍යාපාරයේ දී බර කතය අහිමිවන ක්‍රියාවක් පිළිබඳව නබි (සල්) තුමා දේශනා කළ කරුණ කුමක් ද?
(1) සිකුරාදා දිනයන්හි ව්‍යාපාර කිරීම. (2) කිරුම් මිනුම් වංචා කිරීම.
(3) ව්‍යාපාරයේ බොරු දිව්රුම් සිදු කිරීම (4) බාල භාණ්ඩ විකිණීම.

(24) අල්ලාහ් අනුමත කළ දේ අතරින් ඔහුට ඉතාම පිළිකුල් සහගත දෙයක් බව හදීසයේ පවසන ක්‍රියාව කුමක් ද?
(1) බහු විවාහය (2) පොළිය (3) තලාක් (4) භාරකාරත්වය

(25) ස්ථිර මහ්රම් කෙනෙකි.
(1) පුතාගේ බිරිඳ (2) බිරිඳගේ මවගේ සහෝදරිය
(3) බිරිඳගේ සහෝදරිය (4) බිරිඳගේ පියාගේ සහෝදරිය.

(26) යමාමා යුද්ධය හේතුකොටගෙන අල්- කුර්ආනය ග්‍රණ්ථාරූඪ කිරීමට උපදෙස් ලබා දුන් සහාබිවරයා කවු ද?
(1) අබුබක්කර් (රළි) (2) උමර් (රළි)
(3) උස්මාන් (රළි) (4) හුසෙයිෆතුල් යමානි (රළි)

(27) මහ්ෂර් පිටියේ අර්ෂ් සෙවණේ නැවතී සිටීමට අවස්ථාව ලැබෙන කාණ්ඩ හතෙන් එක් කණ්ඩයමක් වන්නේ,
(1) රාත්‍රී කාලය මුළුල්ලේම නැමදීම කරන්න. (2) දේව භිය මැතියෙන් හැදුණු තරුණයා.
(3) අදිකව සකාත් ගෙවන්නා. (4) දිවා කාලයේ ම උපවාස සුරකින්නා.

(28) ''ෆික්හුල් අව්ලවියියාත්'' යනුවෙන් හැඳින්වෙන වචනයේ අර්ථය කුමක් ද?
(1) පෙළගැස්ම (2) පිළිවෙත් සුරකීම
(3) නීති මූලාශ්‍ර (4) ෆික්හ් ක්ෂේත්‍රයේ විද්වතුන්

(29) පහත සඳහන් පද අතරින් නබි(සල්) තුමාව කෙසේ හඳුන්වනු ලබන්නේ ද?
(1) රහ්මතුල් ලීල් ආලමීන් (2) රබ්බුල් ආලමීන්
(3) හුදන්ලින් නාස් (4) දික්රා ලීල් ආලමීන්.

(30) මෙලොව අල්ලාහ්ට අල්පයක්, බාල එකක් බව සහබාවරුන්ට හේතු ගැන්වීම සඳහා නබි (සල්) තුමාණෝ පෙන් වූ උදාහරණය කුමක් ද?
(1) පොළොව මත සෘජු රේඛාවක් ඇඳ පෙන්වීම.
(2) ජනාසා භූමි දානය කිරීමේ දී දේශනාව පැහැදිලි කිරීම

Department of Education - Western Province

(3) කන කැපූ එළු ඔළුවක් දැක එය අතටගෙන ඔහු මෙය මිලට ලබා ගැනීමට කැමැතිදැයි විමසීම.

(4) හජ්ජතුල් විදඃ අවසන් දේශනාවේ කරුණු පැහැදිලි කිරීම

(31) සිදුවීම් පහක් සිදු වීමට පෙර ඇති අවස්ථා පහක් උපයෝගී කර ගත යුතුය. මින් එකක් වනුයේ,

(1) විවාහයට පෙර තරුණ විය. (2) කියාමාවට පෙර තව්බාව.

(3) දිවා කාලයට පෙර රාත්‍රී කාලය. (4) රෝගී වීමට පෙර නිරෝගී බව.

(32) ජුම්මා සලාතය ඉටු කරමින් සිටින අවස්ථාවේ කෙනෙකු සිහි නැතිව වැටීමෙන් තුවාල විය. ඔහු ලඟ සලාතය කරමින් සිටි පුද්ගලයා කුමක් කළ යුතු ද?

(1) තම සලාතය සම්පූර්ණයෙන් ම නවතා ඔහුට උදව් කිරීම.

(2) තම සලාතය අත්හැර ඔහුට උදව් කිරීම.

(3) කවුරු හෝ කෙනෙකු උදව් කරතැයි සිතීම.

(4) ඉමාම්ට සලාතය නවත්වන්නැයි කීම.

(33) එක් මුස්ලිම් වරයෙක් ජීවිතයේ තුන් ආකාරයක වගකීම් ඉටු කළ යුතු බව නියම වී ඇත. ඒවා කුමක් ද?

(1) ඊමාන්, ඉබාදත්, මුඅමලාත්. (2) අකිදා , ඉබාදත්, ෂරිඅත්.

(3) ඉබාදත්, ඉමාරත්, කිලාෆත්. (4) ෂරිඅත්, අකිදත්, ඉබාදත්.

(34) නබි(සල්) තුමා සහා සහබාවරුන්ගේ ජීවන ක්‍රමය අනුගමනය කරන්නන් කවුරුන් ද?

(1) අහ්ලුල් සුන්නාහ් වල් ජමාආ (2) අහ්මදියාවරු.

(3) ෂිආවරු. (4) ජබරියාවරු.

(35) නබි(සල්) තුමාගේ කාලයේ ඉස්ලාමය පිළිගන්නන් ඉදිරියේ කුර් ආනයේ අවධානය වෙනස් කිරීම සඳහා , ගායනා කිරීමට හැකි දක්ෂ ගායකයකු නියමිත මුදල දී මිලදී ගෙන ගායනා කරවූ අය කවරෙක් ද?

(1) අබුජහල් (2) නල්ර් ඉබ්නු හාරිද් (3) අබු සුෆියාන් (4) ඉම්රාවුල් කයිස්

(36) මිනිසුන්ට පහසු කරන්න අපහසු තාවයට පත් නොකර උනන්දු කරවන්න., පිළිකුල් ඇති නොකරන්න, යනුවෙන්,

(1) ඉමාම් ෂාෆි(රහ්) තුමාගේ වදනකි. (2) ඉමාම් හසනුල් බසරි (රහ්) තුමාගේ වදනකි.

(3) නබි මුහම්මද් (සල්) තුමාගේ වදනකි. (4) අල් - කුර්ආනයේ වදනකි.

(37) ''අ'' කොටසේ රටවලට මුහම්මද් නබි(සල්) තුමාගේ දූතයන් ලෙස ගිය අය ''ආ'' කොටසේ සඳහන් වී ඇත. ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. ඇබීසීනියා | A - මු ආද් ඉබ්නු ජබෙල් |
| 2. මදීනා | B - ජවුෆර් ඉබ්නු අබුතාලිබ්. |
| 3. යමාමා | C - මුස්අබ් ඉබ්නු උමයිර් |

(1) BAC (2) CAB (3) BCA (4) ACB

(38) බනු මුස්තලක් ගෝත්‍රිකයන් ආගම වෙනස් කළ බව ආරංචිවීමෙන් පසු නබි (සල්) තුමා එහි සත්‍යතාවය සොයා බැලීමට යැවූ කෙනෙකි.

(1) අබුබක්කර් (රළි) (2) කාලිද් ඉබ්නු වලිද්(රළි)

(3) මු ආවියා (රළි) (4) උමර් (රළ)

(39) ඉස්ලාමීය දූත මෙහෙවර පිළිබඳව දැන ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් දූත කණ්ඩායමක් අරාබියට ගිය සිදු වීම පිළිබඳ ඉබ්නු සහ්රයාර් සඳහන් කර ඇති ග්‍රන්ථය,

(1) බුදාහියිල් බුල්දාන් (2) තාරිකුල් බිලාද් (3) අජාඉබුල් හින්ද් (4) අල්කියා බාකරි.

Department of Education - Western Province